{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்கலாம் - வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

| 13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පැය 02 |
|---|---|---|

**45 S I - බෞද්ධ ශිෂ්ටාචාරය**

පාසලේ නම :- ..............................................................................

ඇතුළත්වීමේ අංකය :- ..............................................................................

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **1. 2. 3. 4. 5. යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. බමුණන් විසින් හඳුන්වා දුන් ප්‍රධාන සංකල්පයක් ලෙස ස්වධර්ම සංකල්පය හඳුන්වා දිය හැකිය. එහි දී වෛශ්‍ය වර්ණයට අහිමි වූ ස්වධර්ම පමණක් දැකිය හැකි වරණය නම්,
   1. මුදල් පොලී කිරීම, දන්දීම, යාග කරවීම යි.
   2. යාග කරවීම, ප්‍රජා පාලනය, දන් පිළිගැනීම යි.
   3. කෘෂිකර්මාන්තය, කාමයේ නොඇලීම, යාග කරවීම යි.
   4. සත්ත්ව පාලනය, ඉගැන්වීම, ප්‍රජා පාලනය යි.
   5. යාග කිරීම, වෙළඳාම, දන් පිළිගැනීම යි.

2. මෙලොව හා පරලොව දියුණුව සඳහා බමුණන් හඳුන්වා දුන් එකම ක්‍රියාවලිය වූයේ යාගය යි. ඒ සඳහා යාග ක්‍රම ගණනාවක් හඳුන්වා දුන්හ, එහි දී **නිරග්ගල** යාගය ලෙස හැඳින්වූයේ,
   1. සතුන් හා ද්‍රව්‍ය රැස්කොට ඒ සතුන් මරා, ගිනිපුදා බ්‍රාහ්මණයින්ට දන් දී සිදුකරන යාගය යි.
   2. අශ්වයින් මරා රුධිරය යාග ගින්නට දමා සිදුකරන යාගය යි.
   3. පුරුෂයින් මරා එම රුධිරය මගින් සිදුකරන යාගය යි.
   4. යාගස්ථම්භවල ගවයින් බැඳ මන්ත්‍ර කියා ගෙල සිඳ, එම ලෙයින් සිදුකරන යාගය යි.
   5. අමාවක හා පසළොස්වක දිනයන්හි සිදු කරන යාගය යි.

3. ග්‍රීෂ්ම ඍතුවේ දී පංචවිධ අග්නියෙන් දුක් විඳිමින්, වර්ෂා ඍතුවේ දී අහස තම සෙවණ කොට වාසය කරමින්, ශීත ඍතුවේ දී තෙත් වූ ඇඳුම් අඳිමින් දුෂ්කරව ගත කළ යුතු අවධිය ලෙස හඳුනාගත හැක්කේ,
   1. ගෘහස්ථ අවධිය යි.
   2. වනප්‍රස්ථ අවධිය යි.
   3. බ්‍රහ්මචාරී අවධිය යි.
   4. උපනිෂද් අවධිය යි.
   5. සන්‍යාසි අවධිය යි.

4. භාරතීය වනිතාව උසස් නිදහසක් හිමිකරගනු ලැබුවේ භික්ෂුණී ශාසනය ආරම්භ කිරීමත් සමඟයි. දැඟුල් නුවණ ඇති ස්ත්‍රියට ද විමුක්තිය ලැබිය හැකි බව මාරයාට සිදුකරන ලද ප්‍රකාශ වලින් ද පැහැදිලි වේ. එහි දී **"ඉත්ථීභාවෝ කිං කයිරා චිත්තම්හි සුසමාහිතේ"** යනුවෙන් මාරයාට පිළිතුරු දෙනු ලැබුවේ,
   1. සෝමා තෙරණිය යි.
   2. ඛේමා තෙරණිය යි.
   3. වජිරා තෙරණිය යි.
   4. නන්දා තෙරණිය යි.
   5. උත්පලවණ්ණා තෙරණිය යි.

5. පහත දැක්වෙන්නේ භාරතයේ පැවති ප්‍රධාන ආගමික සම්ප්‍රදායන් පිළිබඳ තොරතුරු කිහිපයකි.

A. හිස රැවුළු මුඩු කළ සන්සුන්ව ගමන් කරන පිරිසක් වීම.

B. අභ්‍යන්තර හා බාහිර පාරිශුද්ධත්වයෙන් යුතු පිරිසක් වීම.

C. අගාරික ප්‍රතිපදාව පිළිගැනීම.

D. සියලු දෘෂ්ටි ග්‍රහණයෙන් හා උපාදානයන්ගෙන් තොරවීම.

E. පුද්ගල ස්වච්ඡන්දතාව, ස්වාධීනත්වය, දේව නිර්මාණයට යටත් කිරීම.

මෙයින් බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායේ අනන්‍යතා ලක්ෂණ වන්නේ,

01. A, B, D,  02. A, C, E ය.  03. C, E, B ය.
04. E, B, C ය.  05. E, C, B ය.

6. ෂට් ශාස්තෘන් පිළිබඳව තොරතුරු අධ්‍යයනය කිරීමේ දී අමරාවික්ඛේපවාදය මූලික කරගත් ඉගැන්වීමක් කරන ලද ශාස්තෘවරයා ලෙස සංජය බෙල්ලට්ඨිපුත්ත හඳුන්වා දිය හැකිය. එහි එන **"තථාතිපි මේ නෝ "** යන්නෙහි අර්ථය වූයේ,

01. 'මේ කාරණය එසේම යැයි ද මට අදහසක් නැත' යන්න යි.
02. 'මේ කාරණය මෙසේ යැයි මට අදහසක් නැත' යන්න යි.
03. 'මේ කාරණය නැතැයි ද මගේ අදහසක් නැත' යන්න යි.
04. 'මේ කාරණය නැත්තේ නැතයි ද මට අදහසක් නැත' යන්න යි.
05. 'මේ කාරණය වෙන සැටියකින් යැයි ද මට අදහසක් නැත' යන්න යි.

7. පහත දැක්වෙන්නේ බුද්ධකාලීන ප්‍රධාන රාජ්‍ය හා ජනපද සමඟ බුදුරජාණන් වහන්සේ පවත්වන ලද සබඳතා පිළිබඳ තොරතුරු කිහිපයකි.

A. බුදුරජාණන් වහන්සේ අන්තිම වස් කාලය ගත කිරීම.

B. ජේතවනාරාමයේ වස් කාළ 19 ක් ගතකරමින් වැඩ සිටීම.

C. රාජ භටයෙන් පැවිදි නොකළ යුතු යැයි අනුදැන වදාළ බව.

D. අම්බපාලි වනය පිළිගැනීම හා එහි විවේක සුවයෙන් ගත කිරීම.

E. බුදුරජණන් වහන්සේ ආයු සංස්කාරය අතහැරීම.

මෙයින් වජ්ජි ජනපදය අතර පැවති සබඳතා තහවුරු කරන තොරතුරු පමණක් ඇතුළත් වරණය,

01. A, C, E ය.  02. A, D, E ය.  03. B, C, D ය.
04. D, E, B ය.  05. E, B, C ය.

8. භාරතයේ දේශීය මාර්ග පද්ධතිය දියුණු වී වෙළඳාම ඉතා ජනප්‍රිය වී ගිය බව භාරතීය තොරතුරු අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වෙයි. ප්‍රධාන වශයෙන් එකල වෙළඳ මාර්ග තුනක් තිබූ බව හඳුනාගත හැකිය. එයට අයත් වෙළඳ මාවතක් ලෙස .................... හඳුනාගත හැකි ය.

1. බරණැස සිට විශාලාව, පැළලුප් නුවර හරහා පැවති මාර්ගය
2. සැවැත් නුවර සිට සාකේත, කොසඹෑ, විදිසා, උදේනි හරහා පැවති මාර්ගය
3. සැවත් නුවර සිට වේරංජාව තෙක් පැවති මාර්ගය
4. උදේනි සිට බරණැස හරහා සැවැත් නුවර තෙක් තිබූ මාර්ගය
5. සාකේත සිට වේරංජාව තෙක් තිබූ වෙළඳ මාර්ගය

9. යහපත් කොට යෙතැ යි
සුන්දර තැනට සැපතැ යි
සොඳුරු බස් කියතැ යි
........................................................ යනුවෙන් කියැවෙන්නේ,

1. පුරිසදම්මසාරථී බුදු ගුණය යි.
2. භගවා බුදු ගුණය යි.
3. සුගත බුදු ගුණය යි.
4. අරහං බුදු ගුණය යි.
5. ලෝකවිදූ බුදු ගුණය යි.

10. භාරතයේ සිටි ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයා බුදුරජාණන් වහන්සේ ය. උන්වහන්සේගේ සුවිශේෂී ගුණ ගණනාවක් බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වෙයි.
**''ඒකාන්තයෙන් මම සසර තරණය කළෙමි, අනුන් ලවා තරණය කරවන්නට සසරින් මිදුනෙමි, අන් අය මුදවන්නට ඉන්ද්‍රිය දමනය කළෙමි.''**
යනා දී වශයෙන් දැක්වෙන පරිදි එයින් හඳුනාගත හැකි උන්වහන්සේගේ සුවිශේෂී ගුණය වන්නේ,

1. මහා ප්‍රඥාව යි.
2. පද්මාකාර ජීවිතය යි.
3. නිදහස් චින්තනය යි.
4. තාදී ගුණය යි.
5. මහා කරුණා ගුණය යි.

11. පහත දැක්වෙන්නේ බුදුරජාණන් වහන්සේ යුතු වූ සුවිශේෂී ලක්ෂණ කිහිපයකි.

A. කොසොල් රජතුමාගේ අසදෘශ මහා දානය මෙන්ම දුගී දුප්පත් දාස දාසීන්ගේ රළු ආහාර ද පිළිගැනීම.
B. සුදුස්සාට සුදුසු තැන ලබා දෙමින් සිව්වණක් පිරිසට අගතනතුරු ප්‍රදානය කිරීම.
C. අග්ගික භාරද්වාජ, චිංචි මානවිකා ආදීන්ගේ ද ආක්‍රෝෂ පරිභව ඉවසීම.
D. කෙලෙස්වලින් ආතුර වූවන් මැද අනාතුරව සිටීම.
E. ජේතවනාරාමය, පූර්වාරාමය ආදී සුවිශේෂී ආරාම මෙන්ම ගිරිශිඛර ආදියේ ද සතුටින් වාසය කිරීම.

මෙයින් තාදී ගුණය පිළිබඳ කියවෙන ප්‍රකාශය වන්නේ.

1. A, B, D ය.
2. A, C, E ය.
3. C, B, A ය.
4. E, B, D ය.
5. E, C, B ය.

12. **''බුදුරජාණන් වහන්සේ ලෞකික ආසා නැමති ගිනිගත් නිවස තුළ දැවෙන දරුවන් බේරා ගැනීමට මාර්ග යොදන්නා වූත්, බේරා ගැනීමෙන් පසු නිර්වාණය නැමති ආරක්ෂක ස්ථානයට මග පෙන්වන්නා වූත් පියෙකු බඳුය"** මෙවැනි ඇගයීමක් සිදුකරන ලද නූතන චින්තකයෙකු වූයේ.

1. එඩ්වින් ආර්නෝල්ඩ් ය.
2. ඇල්බට් අයින්ස්ටයින් ය.
3. බර්ට්‍රන්ඩ් රසල් ය.
4. මහාචාර්ය ලක්ෂ්මී නරසු ය.
5. මහාචාර්ය සෝණ්ඩර්ස් ය.

13. බුදු සසුනේ දන්දීමේ ඇලුණු උපාසිකාවන් අතර අග්‍ර වූයේ විශාඛා සිටු දේවිය යි. ඇය **ආගන්තුක බත, ගිලන් බත, ගමික බත**, ආදියෙන් උවටැන් කිරීම නිසා උභය සංඝයාගේ මාතාව විය. මෙහි එන ''**ගමික බත"** යනු.

1. දුර බැහැර ගමන් යාමට සිටින භික්ෂූන් වහන්සේලාට වේලාසනින් දානය පිළිගැන්වීමයි.
2. නගරයට ආගන්තුකව වැඩම කළ භික්ෂූන් වහන්සේලාට දානය පිළිගැන්වීමයි.
3. ගිලන් භික්ෂූන්ට උවැටන් කරන භික්ෂූන්ට දෙන දානයයි.
4. ගිලන් වූ භික්ෂූන්ට රෝගී තත්ත්වය ගැන සලකා දෙන දානයයි.
5. ගමක සිටින එක් භික්ෂුවකට පමණක් ලබාදෙන දානයයි.

14. පුද්ගල ස්වාමිත්වය, ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාව හා වගකීම පිළිබඳ බෞද්ධ අදහස් අධ්‍යයනය කිරීමේ දී පුද්ගල ශක්තින් ගණනාවක් පිළිබඳව හඳුනාගත හැකිය. එහි දී '' **පරක්කම ධාතු** ''යනුවෙන් හැඳින්වෙන්නේ,
1. ක්‍රියාවක් ආරම්භ කිරීමයි.
2. වීර්යය පවත්වාගෙන යාමයි.
3. ක්‍රියාව සාර්ථක කර ගැනීමට උපක්‍රම යෙදීමයි.
4. අලසකමින් නික්මීමයි.
5. වීර්යය බලවත් වීමයි.

15. පහත දැක්වෙන්නේ පාලකයා විසින් අනුගමනය කළ යුතු රජ්‍ය පාලන මූලධර්ම කිහිපයකි.
A. අපරාධ මර්දනය කරමින් අපරාධ මැඩ පැවැත්වීම.
B. අගතිගාමී නොවී අවංකව ක්‍රියා කිරීම.
C. නිර්ධනයන්ට තමා අභිමත කර්මාන්ත සඳහා ධනය ලබා දීම.
D. මහජනයා වෙනුවෙන් කාලය, ශ්‍රමය හා භෞතික සම්පත් කැප කිරීම.
E. ඉන්ද්‍රිය දමනය, පව්ටු සිතිවිලිවලට වහල් නොවී කටයුතු කිරීම.
මෙයි දසරාජ ධර්මවල අඩංගු කරුණු ඇතුළත් වන්නේ,
1. A, B, C, ය.   2. B ,A, D ය.   3. B ,D, E ය.
4. B, E, A ය.   5. E, A, C ය.

16. **''අම්හාකං සාලිනං භාගං අනුප්පදස්සාමි''** යනුවෙන් පාලිතයන් පාලකයා කෙරෙහි බඳු ගෙවිය යුතු බව සඳහන්වේ. මේ පිළිබඳ තොරතුරු සඳහන් බෞද්ධ මූලාශ්‍රය වන්නේ,
1. රජ්ජ සූත්‍රය යි.   2. මහා පරිනිබ්බාන සූත්‍රය යි.
3. අග්ගඤ්ඤ සූත්‍රය යි.   4. චක්කවත්ති සීහනාද සූත්‍රය යි.
5. කූටදන්ත සූත්‍රය යි.

17. බෞද්ධ ඉගැන්වීම් තුළ දස පුණ්‍යක්‍රියා යනුවෙන් පුණ්‍යක්‍රියා දහයක් හඳුන්වා දෙයි. එහි **අපචායන** යනුවෙන් හැඳින්වෙන්නේ,
1. වතාවත් කිරීම යි.   2. පිදිය යුත්තන් පිදීම යි.
3. නිවැරදි දැක්මෙන් කටයුතු කිරීම යි.   4. කේළාම් කීමෙන් වැළකීම යි.
5. පරුෂ වචනයෙන් වැළකීම යි.

18. ගෘහස්ථයකු පංචශීලයට අමතරව සතර පෝයට අෂ්ටාංග සීලයෙන් ද සංවර විය යුතු බව බෞද්ධ ඉගැන්වීමයි. මෙහි අටසිල්වල එන තුන්වන ශික්ෂාපදය,
1. අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
2. කාමේසුමිච්චාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
3. උච්චාසයන මහාසයනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
4. විකාලභෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
5. නච්ච ගීත වාදිත විසූක දස්සනා වේරමණී සික්ඛාපදං සමාදියාමි.

19. පුද්ගලයාගේ හා සමාජයේ යහපැවැත්මට උපකාරී වන බෞද්ධ ආචාර ධර්ම ගණනාවක් වෙයි. එහි එන **චතු අප්පමඤ්ඤා** යනු,
1. සතර සංග්‍රහ වස්තුව යි.   2. අතර අගතිය යි.
3. සතර බ්‍රහ්ම විහරණ යි.   4. සතර කර්මක්ලේෂ යි.
5. සතර ආරූප්පය යි.

20. දිළිඳුකම කාමභෝගී ගිහියාට දුකක් බව දක්වන බුදු දහම ප්‍රමාණවත් ධනයක් උපයා ගත යුතු බව සඳහන් කරයි. එසේම සම්පත් පරිභෝජනයෙහි ලා පරිභෝජන දර්ශනයක් ද බුදු දහමින් සඳහන් කරන අතර එහි **අනජ්ඣාපන්නෝ** යනුවෙන් සඳහන් කරන්නේ,
 1. අසීමිත ආශාවන්ගෙන් මුලා නොවීම යි.
 2. සම්පත් භාවිතයෙන් වැරදි දේට නොයෑම යි.
 3. වෙන්වීම හෙවත් මිදීම යි.
 4. අන්ධයකුමෙන් ආශාවන් පසුපස නොයෑම යි.
 5. අවශ්‍යතා දැන පරිභෝජනය කිරීම යි.

21. බුදුදහම ධනෝපායනය ධන පරිහරණය හා ආර්ථික සුරක්ෂතාව පිළිබඳව මැනවින් කරුණු දක්වන දහමකි, එහි දී ධන පරිහරණය පිළිබඳව උපදෙස් ලබාදෙන සූත්‍රයක් ලෙස රාශිය ගාමිණී සූත්‍රය පෙන්වා දිය හැකිය. රාශිය ගාමිණී සූත්‍රයේ දී ධන පරිහරණය පිළිබඳව සඳහන් නොවන කරුණක් වන්නේ,
 1. දැහැමින් ඉපයම.
 2. පරිත්‍යාග කිරීම.
 3. ගිජුකමින් තොරව ධනය පරිහරණය කිරීම.
 4. වෙන්වීම හෙවත් මිදීම.
 5. තමා සැපවත් වීම.

22. භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ විනය පිටකයෙන් බොහෝ තොරතුරු සපයා ගත හැකිය. බුදුරජාණන් වහන්සේ ආරාමික සම්පත් කළමනාකරණය සඳහා තනතුරු ගණනාවක් හඳුන්වා දී ඇත. පහත දැක්වෙන්නේ ඉන් කිහිපයකි.

A. චීවර භාජක
B. අප්පමත්ත විස්සජ්ජක
C. ඛජ්ජභාජක
D. පත්තගාහාපක
E. භත්තුත්දේසක

මෙයින් **සිවුරු බෙදා දෙන්නා, අල්පමාත්‍ර පිරිකර බෙදා දෙන්නා** හා පාත්‍ර ලබා දෙන්නා යන තනතුරු පමණක් ඇති වරණය වන්නේ,

 1. A, B, D ය.
 2. A, B, E ය.
 3. B, C, E ය.
 4. B, D, E ය.
 5. E, A, C ය.

23. ධනෝපායනය පිළිබඳව තොරතුරු දක්වන බුදු දහම එය සැහැසිකම්වලින් තොරව ධාර්මිකව සිදු කළ යුතු බව සඳහන් කරන අතර, ධනය ඉපයීමේ දී අනුගමනය නොකළයුතු වංචනික ක්‍රම ගණනාවක් ද හඳුන්වා දී ඇත. එහි එන **කංසකූට** යනු,
 1. තරාදියෙන් කරන සොරකම් ය.
 2. වටිනා භාණ්ඩ ලෙස පෙන්වා රවටා කරන මුදල් පිළිබඳ වංචා ය.
 3. කෙත් වතු ආදිය මනින විට සිදුකරන වංචා ය.
 4. අල්ලස් ගැනීම් හා උපාය මගින් රැවටීම ය.
 5. රන් නොවන දේ රන් කොට හා මැණික් නොවන දේ මැණික් කොට වංචා කිරීම ය.

24. සෞන්දර්ය පිළිබඳව මනා ඉගැන්වීමක් සිදුකරන බුදු දහම ඇලීමකින් තොරව එය විඳිය යුතු බව දක්වයි. **"ලොව විසිතුරු දෑ කාමයෝ නොවෙති. කාමය වන්නේ පුද්ගලයා තුළ පවතින්නා වූ රාගයයි. ලොව විසිතුරු දෑ එලෙසම පවතී."** යනුවෙන් සඳහන් කරයි.
මේ පිළිබඳව සඳහන් ගාථාවේ මුල් පදය වන්නේ,
 1. '' දුමානි වුල්ලානි මනෝරමාණි" යන්න යි.
 2. '' නතේ කාමායානි චිත්‍රානි ලෝකේ" යන්න යි.
 3. '' ජන්නා මේ කුටිකා සුඛා නිවාතා" යන්න යි.
 4. '' සුනීල ගිවා සුසිඛා සුපෙඛුනා" යන්න යි.

5. '' රමණීයං අරඤ්ඤානි යත්ථන රමති ජනෝ " යන්න යි.

25. සැපය පිළිබඳව තොරතුරු සඳහන් කරන බුදුසමය තුළ ප්‍රධාන සැප වර්ග හතරක් අණන සූත්‍රයේ දී පෙන්වා දෙයි. එහි එන වැරදි ක්‍රියාවලින් තොරව නිවැරදි ජීවිතයක් ගත කිරීමෙන් ලබන සැපය වන්නේ,

1. අත්ථි සුඛය යි.
2. අණන සුඛය යි.
3. භෝග සුඛය යි.
4. සාතාරම්මණ සුඛය යි.
5. අනවජ්ජ සුඛය යි.

26. අගාරික ජීවිතය සංවර්ධනය කර ගැනීම සඳහා උපදෙස් සපයන සූත්‍රයක් ලෙස සිගාලෝවාද සූත්‍රය හඳුනාගත හැකිය. එහි ප්‍රධාන දිසා හයකට සමාජ සංස්ථා පෙන්වා දී ඇත.

A. පුරත්ථිමා දිසා
C. පච්ඡිමාදිසා
E. උපරිමාදිසා
B. හෙට්ඨිමාදිසා
D. උත්තරාදිසා

මෙයින් යට දිසාව හා බස්නාහිර දිසාව අර්ථවත් වන වරණය,

1. A හා B ය.
2. B හා C ය.
3. C හා A ය.
4. C හා D ය.
5. E හා C ය.

27. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් මිත්‍ර සංකල්පය අතරින් **''අනුප්පියභාණී''** මිත්‍රයාගේ ලක්ෂණයක් නොවන්නේ,

1. නිතරම මිත්‍රයාගෙන් යමක් ගැනීමට කටයුතු කිරීම යි.
2. මිත්‍රයාගේ මුහුණට හොඳ කීම යි.
3. හොඳ වැඩ අනුමත කිරීම යි.
4. නැති තැන දොස් කීම යි.
5. නරක වැඩ අනුමත කිරීම යි.

28. පුද්ගලයාගේ මෙලොව හා පරලොව දියුණුවට හේතුවන කරුණු ඇතුළත් **මහා මංගල සූත්‍රය** දේශනා කරන ලද්දේ බුදුරජාණන් වහන්සේ,

1. රජගහනුවර වේළුවනාරාමයේ වැඩ සිටිය දී ය.
2. සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ සිටිය දී ය.
3. විශාලා මහනුවර කූඨාගාර ශාලාවේ වැඩ සිටිය දී ය.
4. කිඹුල්වත්පුර නිග්‍රෝධාරාමයේ වැඩ සිටිය දී ය.
5. පැළලුප් නුවර අශෝකාරාමයේ වැඩ සිටිය දී ය.

29. පහත දැක්වෙන්නේ භික්ෂු භික්ෂුණීන් වහන්සේලාගේ ධර්මදූත සේවාව සම්බන්ධ තොරතුරු කිහිපයකි.

A. චාලා, උපචාලා, සිසූපචාලා යන සහෝදරියන් මෙන්ම තම මවට ධර්මාවබෝධය ලබාදීම.
B. ගැඹුරු දහම් කරුණු සරලව උපමානුසාරයෙන් විස්තර කිරීමේ හැකියාවක් තිබීම.
C. එකම ආරාමයක, එක ප්‍රදේශයක දවස් දෙකක් වැඩ සිටීමෙන් වැළකී සිටීම.
D. ''සත්ත්වයා කවරෙකු විසින් නිර්මාණය කරන ලද්දේ ද'' යනාදී වශයෙන් මාරයා අසන ලද ප්‍රශ්නවලට නොපැකිළිව පිළිතුරු දීම.
E. දරුණු මිනිසුන් සිටි සුනාපරන්ත දේශයේ ධර්මදූත සේවාවේ යෙදීම.

මින් සැරියුත් හිමියන් හා කාශ්‍යප හිමියන්ගේ ධර්මදූත සේවාව පිළිබඳව පමණක් තොරතුරු කියවෙන වරණය වන්නේ,

1. A, B, C ය.
2. A, D, E ය.
3. B, C, E ය.
4. C ,D, E ය.
5. D, B, E ය.

30. බුද්ධ පරිනිර්වාණයෙන් මාස තුනකට පසුව සිදුකරන ලද සංගායනාව ප්‍රථම ධර්ම සංගායනාව යි. මෙහි දී ධර්මය කට පාඩමින් ඉදිරියට පවත්වාගෙන යන භාණක පරම්පරාවක් ඇති කරන ලදී. ඒ පිළිබඳව නිවැරදි වරණය ලෙස හඳුනාගත හැක්කේ,
   1. මජ්ඣිම නිකාය - සැරියුත් හිමියන්ගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාව යන්න යි.
   2. දීඝ නිකාය - අනුරුද්ධ හිමි ඇතුළු ශිෂ්‍ය පරපුර යන්න යි.
   3. අංගුත්තර නිකාය - පොදුවේ සියලුම භික්ෂූන්ට යන්න යි.
   4. මජ්ඣිම නිකාය - සැරියුත් හිමියන් ප්‍රමුඛ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුරට යන්න යි.
   5. ඛුද්දක නිකාය - අනුරුද්ධ හිමියන්ගේ ශිෂ්‍ය පරපුරට යන්න යි.

31. පළමු ධර්ම සංගායනාවට හේතු විමසීමේ දී ආනන්ද හිමියන්ට එල්ල වූ චෝදනා නිරාකරණය කර ගැනීම ද ඉතා වැදගත් විය. එම චෝදනාවලට අයත් නොවන්නේ,
   1. ඛුද්දානුඛුද්දක ශික්ෂාපද මොනවාදැයි අසා නොදැන ගැනීම යි.
   2. අග්‍ර උපස්ථායක තනතුර ඉල්ලීම් නොකොට ලබා ගැනීම යි.
   3. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දේහය ප්‍රථමයෙන් ස්ත්‍රීන් ලවා වැන්දවීම යි.
   4. බුදුරජාණන් වහන්සේට කල්පයක් කල් වැඩ සිටීමට ආරාධනා නොකිරීම යි.
   5. බුදුරජාණන් වහන්සේගේ වැසි සළුව පයින් මැඩගෙන මැසීම යි.

32. දෙවන ධර්ම සංගායනාවෙන් පසුව මූලිකව සංඝ සමාජය නිකාය වශයෙන් ථේරවාද හා මහා සාංඝික ලෙස බෙදී ගිය බව සඳහන්වේ. පසුකාලීන වන විට ථේරවාදීන් බෙදී ගිය නිකාය ගණන වූයේ,
   1. නිකායන් 06 කි. 2. නිකායන් 11 කි. 3. නිකායන් 12 කි.
   4. නිකායන් 16 කි. 5. නිකායන් 18 කි.

33. පහත දැක්වෙන්නේ භාරතයේ සිටි ප්‍රධාන පාලකයින් හා සම්බන්ධ තොරතුරු කිහිපයකි.
   A. මෞර්ය වංශයේ තුන්වන පාලකයා ය.
   B. කාශ්මීර, යාර්කාන්ඩ්, කෝඨාන්, චීන තුර්කිස්තාන් යනාදී භාරතයෙන් පිට ප්‍රදේශ ද ආක්‍රමණය කරන ලදී.
   C. රාජසභාවේ වසුමිත්‍ර, නාගර්ජුන, අශ්වඝෝෂ, වැනි මහා පඬිවරුන් සිට ඇත.
   D. හිද, අතියොග, අතෙෂු, තුලමයේ, අංතෙකිනේ ආදී ස්ථාන 18ක පමණ ධර්ම ප්‍රචාරය කළ බව සඳහන් වීම.
   E. අවුරුදු හතළිස් දෙකක් රාජ්‍ය පාලනය සිදු කිරීම.

   මෙම තොරතුරු අතරින් කණිෂ්ක රජතුමා පිළිබඳව පමණක් තොරතුරු කියවෙන්නේ,
   1. A, D, E ය. 2. B, C, E ය. 3. C, B, A ය.
   4. C, E, D ය. 5. E, A, C ය.

34. කුෂාණ වංශයෙන් පැවත එන කණිෂ්ක රජු **"ද්විතීය ධර්මාශෝක"** ලෙස ද හඳුන්වයි. එතුමා ........................... තම රාජධානිය කරගෙන රාජ්‍ය පාලනය කළේ ය.
   1. තුර්කිස්ථාන්. 2. වේදිසපුරය. 3. පාඨලීපුත්‍රය.
   4. පුරුෂ පුරය. 5. කාලිංගය.

35. භාරතයේ බෞද්ධ අධ්‍යාපනයේ ශ්‍රී විභූතිය පිළිබඳව තොරතුරු අධ්‍යයනය කිරීමේ දී විශ්ව විද්‍යාලවලට හිමිවන්නේ ප්‍රධාන ස්ථානයකි. එකල පැවති බෞද්ධ විශ්වවිද්‍යාල අතරින් ශ්‍රාවකයාන බුදු සමයේ කේන්ද්‍රස්ථානය වශයෙන් පැවති විශ්වවිද්‍යාලය වූයේ,
   1. වලභි විශ්වවිද්‍යාලය යි. 2. ජගද්දලා විශ්වවිද්‍යාලය යි.
   3. නාලන්දා විශ්වවිද්‍යාලය යි. 4. වික්‍රමශීලා විශ්වවිද්‍යාලය යි.
   5. තක්ෂිලා විශ්වවිද්‍යාලය යි.

36. පණ්ඩුකාභය රජතුමා විවිධ ආගම් හා ඇදහිලි සඳහා අනුග්‍රහයන් සලසා දී ඇති බව ලංකා ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වෙයි. එතුමා **සිවිකා ශාලා** නම් ආගමික ගොඩනැගිලි විශේෂය ඉදිකරදීමෙන් පැහැදිලි වන්නේ ලංකාවේ,

1. බමුණු බලය ව්‍යාප්තව පැවති බව යි.
2. ශිව දෙවියන් පිදීම පැවති බව යි.
3. ජෛන ආගම පැවති බව යි.
4. ආජීවක ආගම පැවති බව යි.
5. යක්ෂ වන්දනාව සඳහා දේවාල බහුලව පැවැති බව යි.

37. බුදුදහම ලංකාවට පැමිණීමත් සමඟ ලක්දිව බොහෝ රජවරු බෞද්ධ මුහුණුවරකින් යුතුව රාජ්‍ය පාලනය කළහ. විශේෂයෙන් රාජ්‍ය පාලනය සඳහා බෞද්ධ භික්ෂූන් වහන්සේලා උපදේශකත්වයට පත් කර ගැනීම සුවිශේෂ කාරණාවකි. ඒ අනුව පහත දැක්වෙන වරණ වලින් රජු හා උපදේශකත්වය දරන ලද භික්ෂුව පිළිබඳ නිවැරදි ප්‍රකාශය,

1. වළගම්බා රජු - ගෝඨගත්ත තිස්ස හිමි.
2. ජෙට්ඨතිස්ස රජු - සංඝමිත්‍ර හිමි.
3. මහසෙන් රජු - කුපික්කල තිස්ස හිමි.
4. වලගම්බා රජු - සංඝමිත්‍ර හිමි.
5. දුටුගැමුණු රජු - ගෝඨගත්ත තිස්ස හිමි.

38. පහත දැක්වෙන්නේ මහින්දාගමනයෙන් පසු ලංකාවේ පාලකයන් විසින් ඉදිකරන ලද පූජනීය ස්ථාන කිහිපයකි.

A. අශෝකාරාමය
B. සෝමාරාමය
C. ලෝවාමහා ප්‍රාසාදය
D. තිස්ස මහා විහාරය
E. ඉසුරුමුණි විහාරය

මෙයින් දේවානම්පියතිස්ස රජතුමා විසින් කරවන ලද ස්ථාන ඇතුළත් වරණය වන්නේ,

1. A,B,C ය.
2. A,D,E ය.
3. A,D,C ය.
4. D,E,B ය.
5. E,B,D ය.

39. බුදුදහම ලංකාවට පැමිණීමෙන් පසු ලක්දිව විවිධ රජවරු ආගමික වශයෙන් විවිධ අනුග්‍රහයන් කර ඇති බව විවිධ සාධක මගින් හඳුනාගත හැකිය. එයට අනුව අභයගිරි වාසී මහා නාග තෙරුන්ට රත්නප්‍රාසාද මන්දිරය කිරීමෙන් අනුග්‍රහය දක්වන ලද්දේ,

1. ගජබා රජුය.
2. නිශ්ශංකමල්ල රජුය.
3. කනිට්ඨතිස්ස රජුය.
4. වළගම්බා රජුය.
5. දේවානම්පියතිස්ස රජුය.

40. තමා සතුදෙය පරිත්‍යාග කිරීම දානය වශයෙන් හැඳින්විය හැකි අතර එය ආමිස දානය, අභය දානය, ධර්ම දානය, පත්ති දාන වශයෙන් ආකාර කීපයකට බෙදේ. එයින් **ආමිස දානය** ලෙස හඳුන්වන්නේ,

1. දහම් පොතපත ලිවීම යි.
2. මියගිය අයට පින් ලබාදීමෙන් සිදුකරන දානය යි.
3. ආහාර පාන, ඇඳුම් පැළඳුම්, ගෙවල් දොරවල් ආදී ද්‍රව්‍ය ලබාදීමෙන් සිදුකරන දානය යි.
4. මරණයට කැප කර ඇති සත්ත්වයන් එයින් නිදහස් කොට ජීවිතය ලබාදීම යි.
5. ධර්මය නොදත් පිරිසකට ධර්මය දේශනා කිරීම යි.

41. ථෙරවාදී බෞද්ධ රාජ්‍යයක් ලෙස බ්‍රහ්ම දේශය, මරම්ම දේශය, යනුවෙන් හැඳින්වෙන මියන්මාරය හඳුන්වා දිය හැකිය. මියන්මාරයට බුදු දහම ලැබීම පිළිබඳව ජනප්‍රවාද මෙන් ම පුරාවිද්‍යාත්මක තොරතුරුවලින් ද කරුණු හඳුනාගත හැකිය. කෙසේ වෙතත් මියන්මාරයට ස්ථිර වශයෙන්ම බුදු දහම ලැබී තහවුරු වූයේ,

1. ක්‍රි.පූ 329 දී ය.
2. ක්‍රි.ව 8 වන සියවසේ දී ය.
3. ක්‍රි.ව 11 වන සියවසේ දී ය.
4. ක්‍රි.ව 12 වන සියවසේ දී ය.
5. ක්‍රි.ව 433 දී ය

42. තායිලන්තයට බුදු දහම ලැබීමත් සමඟ තායි ජන ජීවිතයට බෞද්ධ සාරධර්ම මිශ්‍ර වී ගියේ ය. තායි බසින් **"ඩෙක්වට්"** නමින් හඳුන්වන්නේ,

1. භික්ෂූන් වහන්සේලා ය.
2. පන්සල්වල නැවතී සිටින ළමයින් ය.
3. පන්සල් ඉදි කරනු ලබන නිර්මාණ ශිල්පීන් ය.
4. සඟරජ හිමියන්ට කියන තවත් නමකි.
5. තායිලන්තයේ බෞද්ධ උත්සවයකි.

43. කොරියාවේ කුදාරා රාජ්‍යයේ පාලකයා විසින් ජපානයට බුදු දහම හඳුන්වා දෙන විට ජපානයේ පැවති ගෝත්‍ර අතුරෙන් බුදු දහම පිළිගැනීමට විරුද්ධ වූයේ,

1. සෝගා හා නකතොමි වංශිකයන් ය.
2. සෝගා හා මොනෝනොබේ වංශිකයන් ය.
3. මොනෝනොබේ හා නකතොමි වංශිකයන් ය.
4. සෝගා වංශිකයන් පමණි.
5. සෝගා, මොනෝනොබේ, නකතොමි යන වංශිකයන් ය.

44. ජපානයට බුදු දහම පැමිණීමත් සමඟ ජපන් සංස්කෘතිය ද බුදු දහමින් පෝෂණය විය. ඒ තුළින් විවිධ බෞද්ධ උත්සව ගණනාවක් ඇති විය. එයින් බුදුරජාණන් වහන්සේ **බුද්ධත්වයට පත් වූ දිනය සැමරීම** වෙනුවෙන් පවත්වන උත්සවය,

1. බොන් උත්සවය යි.
2. ජෝදෝ උත්සවය යි.
3. නෙහෙට උත්සවය යි.
4. තේපානෝත්සවය යි.
5. හනමත්සුරි උත්සවය යි.

45. පහත දැක්වෙන්නේ බුද්ධ ප්‍රතිමා කලාවේ මුද්‍රාවලින් පිළිබිඹුවන සංකේත කිහිපයකි.

A. පොරොන්දු ඉටුකිරීම, පරිත්‍යාගශීලී ගුණය.
B. ගැටලුවක් විසඳීම හෝ ධර්මය පැහැදිලි කිරීම.
C. ලෝ සතුන්ගේ බිය දුරු කිරීම.
D. සිත එකඟ කර ගැනීම.
E. පාරමිතා පිරූ බවට මහපොළව සාක්ෂි දැරීම.

මෙයින් වරද මුද්‍රාව හා විතර්ක මුද්‍රාව හඳුනාගත හැක්කේ,

1. A හා B වලිනි.
2. A හා C වලිනි.
3. A හා E වලිනි.
4. B හා E වලිනි.
5. C හා B වලිනි.

46. ස්තූපයේ බඳ කොටස හෙවත් ගර්භයේ හැඩය අනුව ප්‍රධාන වශයෙන් ආකෘති හයකි. එයින් පද්මාකාර හා ඝණ්ඨාකාර ස්ථූපවලට උදාහරණ වන්නේ,
1. සෝමාවතී ස්තූපය හා ලංකාරාම ස්ථූපය යි.
2. රුවන්වැලි සෑය හා සෝමාවතී ස්ථූපය යි.
3. කතරගම කිරිවෙහෙර හා කැළණි ස්ථූපය යි.
4. යුදගණා ස්තූපය හා ලංකාරාම ස්ථූපය යි.
5. කැළණි ස්තූපය හා ලංකාරාම ස්ථූපය යි.

47. සඳකඩපහණ පිළිබඳව විවිධ විද්වතුන් අදහස් දක්වා ඇති අතර එයින් **''සඳකඩපහණ ආශ්‍රමයක හෝ විහාර මන්දිරයක හෝ ප්‍රාසාදයක හෝ පළමු පියගැටය සමගම යාවී ඇති හෙයින් එහි මැද ඇති විකසිත නෙළුම්පත් රටාව ශුද්ධ ස්ථානයකට ඇතුළු වීමේ දී බැතිමතුන්ගේ ආත්ම පූජාවෙන් කොටසක් සංකේතවත් කරන බව''** සඳහන් කරන්නේ,
1. විනී විතාරණ මහතා ය.
2. විලියම් ඊ. වෝඩ් මහතා ය.
3. ඩී. ටී. දේවේන්ද්‍ර මහතා ය.
4. එච්.සී.පී. බෙල් මහතා ය.
5. වින්සන්ට් ස්මිත් මහතා ය.

48. ගොඩනැගිල්ලකට පිවිසීමට ඇති පියගැට පෙළට දෙපසින් මුරගලට පිටුපසින් පිහිටුවා ඇති ගල් පුවරුව කොරවක්ගලයි. අනුරාධපුර යුගයේ බොහෝ කොරවක්ගල්වල ශීර්ෂය මකර මුඛයකින් නිකුත්වන ලියවැලක ස්වරූපයක් ගනියි. නමුත් පසුකාලීනව ගජසිංහ හිස හා ඇත්හිස යනාදිය ද කොරවක්ගල්වල දක්නට ලැබෙයි. මෙයට උදාහරණයක් වන්නේ,
1. බිසෝ මාළිගයේ ඇති කොරවක්ගල යි.
2. මහනුවර දළදා මාලිගාවේ කොරවක්ගල යි.
3. මහසෙන් මාළිගාවේ කොරවක්ගල යි.
4. අව්කන පිළිමය අසල ඇති කොරවක්ගල යි.
5. යාපහුවේ හා දඹදෙණියේ දළදා මාළිගාවල ඇති කොරවක්ගල් ය.

49. බුද්ධ චරිතය, සාසන ඉතිහාසය, බෝසත් චරිතය, ආදිය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා විහාර චිත්‍ර කලාව උපයෝගී කරගෙන ඇත. එම විහාරවල විවිධ චිත්‍ර ශිල්පීන් විසින් චිත්‍ර අඳින ලද බව හඳුනාගත හැකිය. ඒ අතරින් **''සේදවත්ත වෙහෙර ගොඩැල්ල විහාරයේ''** චිත්‍ර අඳින ලද චිත්‍ර ශිල්පියා වූයේ,
1. සෝමබන්ධු විද්‍යාපති මහතා ය.
2. රිචඩ් හෙන්රික්ස් මහතා ය.
3. ජෝර්ජ් කීට් මහතා ය.
4. ඇල්බට් ධර්මසිරි මහතා ය.
5. එම්.සාර්ලිස් මහතා ය.

50. ධර්ම සන්නිවේදනය සඳහා භාවිත කරන ලද මාධ්‍යයක් ලෙස ගීත කලාව හඳුන්වා දිය හැකිය. එය බෞද්ධ ගීත සාහිත්‍ය අධ්‍යයනයේ දී හඳුනාගත හැක. පුද්ගල තෘෂ්ණාව විවිධාකාර බවත් එය විවිධ අවස්ථාවල දී ඉස්මතු වන බවත් පෙන්වා දෙමින් ධර්ම පණිවිඩයක් ලබා දෙන ගීතය වන්නේ,
1. ''අමා දහර දහර දිය ගලා ගලා '' යන ගීතය යි.
2. ''කවාලා විළඳ ජාති ''යන ගීතය යි.
3. ''සොර දෙටුවෙක් කස තැලුම්කකා'' යන ගීතය යි.
4. ''අඩු කුලේ කියාලා අසරණයා'' යන ගීතය යි.
5. ''සොයා පිළිසරණක් ''යන ගීතය යි.

***

{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்களம் - வடமத்திய மாகாணம்
**Department of Education – North Central Province**

| 13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පැය 03 විනාඩි 10 |
| --- | --- | --- |

**45 S II - බෞද්ධ ශිෂ්ටාචාරය**

පාසලේ නම :- ..........................................................................

ඇතුළත්වීමේ අංකය :- ..........................................................................

❖ උපදෙස්

❖ **I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

## I කොටස

1.

I. යාගයක දී සම්බන්ධවන ප්‍රධාන බමුණු පූජකයින් **දෙදෙනෙක්** හා ඔවුන්ගේ කාර්යයන් නම් කරන්න. (ලකුණු 02 යි)

II. බ්‍රාහ්මණ සම්ප්‍රදායේ අනන්‍යතා ලක්ෂණ **තුනක්** ගෙනහැර දක්වන්න. (ලකුණු 03 යි)

III. වජ්ජි රාජ්‍යය හා බුදුරජාණන් වහන්සේ අතර පැවති සම්බන්ධතා සාධක **හතරක්** මගින් දක්වන්න. (ලකුණු 04 යි)

IV. **සංජය බෙල්ලට්ඨිපුත්ත** ශාස්තෘවරයාගේ ඉගැන්වීම් විධිමත්ව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

V. බුද්ධකාලීන භාරතයේ වෙළඳාම හා කර්මාන්ත ඉතා දියුණුව පැවති බවට කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

2.

I. බුදුරජාණන් වහන්සේ **බුද්ධ** යන නාමයෙන් හැඳින්වීමට හේතු සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

II. බුදුරජාණන් වහන්සේගේ නායකත්ව ලක්ෂණ **තුනක්** ගෙනහැර දක්වන්න. (ලකුණු 03 යි)

III. තාදී ගුණය බුද්ධ චරිතයෙන් ප්‍රකට වන ආකාරය සාධක **හතරක්** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)

IV. ප්‍රධාන ශ්‍රාවිකා චරිතයක් ලෙස **ඛේමා රහත් තෙරණියගේ** චරිතය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 05 යි)

V. පුද්ගල ස්වාමිත්වය, ස්වාධීනත්වය හා වගකීම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3.

I. **"යෝචේ වස්සසතං ජීවේ"** යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02 යි)

II. ඉහත (**3.** I) හි සඳහන් ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03 යි)

III. සිගාලෝවාද සූත්‍රයේ එන මිත්‍ර කුලපුත්‍ර යුතුකම් හා වගකීම් **දහය** නම් කරන්න. (ලකුණු 04 යි)

IV. පරාභව ලක්ෂණවලින් ඉවත්වීම පුද්ගල ජීවිතයේ සාර්ථකත්වය සඳහා හේතුවන බව පරාභව ලක්ෂණ **පහක්** මගින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

V. ධනෝපායනය හා ධන පරිහරණය පිළිබඳ බෞද්ධ උපදෙස් මූලාශ්‍ර ආශ්‍රය කරගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## II කොටස

4.

I. බමුණු ඉගැන්වීම් තුළ කාන්තාව පීඩාවට පත් වූ ආකාරය විස්තර කරන්න. (ලකුණු 10 යි)

II. පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල කාලීන වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

5.

I. හොඳ නරක විනිශ්චය කිරීමෙහිලා භාවිත බෞද්ධ නිර්ණායක පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

II. බුදුරජාණන් වහන්සේ ධරමාන සමයේ තත්කාලීන සමාජය බුදුරජාණන් වහන්සේ ඇගයීමට ලක් කළ ආකාරය උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

6.

I. දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමේ හේතු සඳහන් කර එහි ප්‍රතිඵල විස්තර කරන්න. (ලකුණු 10 යි)

II. ධර්මාශෝක රජතුමා **බෞද්ධ නරපතියෙකි** එතුමාගේ ශාසනික සේවාව ඇසුරින් මේ කියමන පහදන්න. (ලකුණු 10 යි)

7.

I. ප්‍රධාන හීනයාන බෞද්ධ විශ්වවිද්‍යාලයක් ලෙස **වලභි විශ්වවිද්‍යාලය** ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10 යි)

II. ජපන් සංස්කෘතිය බුදු දහමින් ලද ආලෝකය විස්තර කරන්න. (ලකුණු 10 යි)

8.

I. ජනකවි සම්ප්‍රදායේ පෝෂණය කෙරෙහි බෞද්ධ ආභාසය ලැබී ඇති ආකාරය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

II. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට ප්‍රමාණවත් සටහන් ලියන්න. (ලකුණු 10 යි)

1. සුභරතාව.
2. භෝග සුඛය.
3. දඹදෙණි යුගයේ සාහිත්‍යය.
4. මුරගල.

* * *



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்கலாம் - வடமத்திய மாகானம்
**Department of Education – North Central Province**

13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය :

**45 S I　　බෞද්ධ ශිෂ්ටාචාරය පිළිතුරු පත්‍රය**

පාසලේ නම :- ........................................................................................

ඇතුළත්වීමේ අංකය :- ........................................................................................

| ප්‍රශ්න අංකය | පිළිතුරු | ප්‍රශ්න අංකය | පිළිතුරු |
|---|---|---|---|
| 1 | 2 | 26 | 3 |
| 2 | 1 | 27 | 1 |
| 3 | 2 | 28 | 2 |
| 4 | 1 | 29 | 5 |
| 5 | 4 | 30 | 1 |
| 6 | 1 | 31 | 2 |
| 7 | 4 | 32 | 3 |
| 8 | 2 | 33 | 2 |
| 9 | 3 | 34 | 4 |
| 10 | 5 | 35 | 1 |
| 11 | 2 | 36 | 2 |
| 12 | 4 | 37 | 5 |
| 13 | 1 | 38 | 2 |
| 14 | 2 | 39 | 3 |
| 15 | 5 | 40 | 3 |
| 16 | 3 | 41 | 3 |
| 17 | 2 | 42 | 2 |
| 18 | 1 | 43 | 3 |
| 19 | 3 | 44 | 2 |
| 20 | 4 | 45 | 1 |
| 21 | 3 | 46 | 4 |
| 22 | 1 | 47 | 2 |
| 23 | 2 | 48 | 5 |
| 24 | 2 | 49 | 4 |
| 25 | 5 | 50 | 3 |

PAST PAPERS WIKI

(13) WWW.PastPapers.WiKi (13)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න